# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,633—1959 ජනවාරි 2 වැනි සිකුරාදා—2.1.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට |
|---|---|
| **අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන** ... | — |
| **අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්** ... | 5 |
| **රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්** | — |
| **අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්** | 6 |
| **වෙනත් පත් කිරීම්** ... ... ... | 7 |
| **රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය** ... ... | — |
| **ආණ්ඩුවේ නිවේදන** ... ... ... | 7 |
| **මිළ පාලන දැන්වීම්** .... .... .... | — |
| **විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්** ... ... | 9 |
| **"සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම්** ... | — |


# අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1959 අංක 1**

අංකය : ඩී.1/රෙක්ට්/16.

## යුද්ධ හමුදව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

**1958** දෙසැම්බර් මස 3 වැනි දින සිට, ලෙප්ට්ටිනන්ට් වරුන් වශයෙන්—

උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඇම්. එච්. ධර්මසිරි, සී.ජී.ඕ.සී.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ටී. ඩී. ජේ. විතාරණ, සී.ජී.සී.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ජී. ගජේන්ද්‍රපූපන්, සී.ජී.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඇෆ්. සී. කොරේරා, සී.ජී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ 1,
**1958** දෙසැම්බර් මස 20 දින.

---

**1959 අංක 2**

අංකය : ඩී.1/රෙක්ට්/26.

## යුද්ධ හමුදව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ඇතුළත් කිරීම්

පහත සඳහන් කරන ලද නිළධාරීන් 1958 නොවැම්බර් මස 16 වැනි දින සිට ඔවුන්ගේ නම්වලට කෙළින් සඳහන් කර තිබෙන බලකායවලට/රෙජිමේන්තු වලට පහත සඳහන් කරන ලද ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙලට ඇතුළත් කොට තිබේ: —

උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ජී. ඇෆ්. එච්. ස්ටෙච්—ලංකා පාබල හමුදව.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ජී. ආරියප්පෙරුම—ලංකා සිංහ රෙජිමේන්තුව.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඩබ්ලිව්. කේ. නානායක්කාර—ලංකා පාබල හමුදව.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් එච්. ඇෆ්. රූපසිංහ—ලංකා තුවක්කු හමුදව.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඇස්. පී. ඉලංගන්තිලක—යුද්ධ හමුද පොලිස් සේවයේ ලංකා බලකාය.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ජී. වී. ඇලපාත—ලංකා තුවක්කු හමුදව.
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඇම්. ඇස්. සී. ද සිල්වා—ලංකා තුවක්කු හමුදව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 දෙසැම්බර් 18 දින.

---

**1959 අංක 3**

## යුද්ධ හමුදව—නිත්‍ය හට හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද තාවකාලික පත්කිරීම සහ උසස් කිරීම

**තාවකාලික පත්කිරීම**

මාණ්ඩලික සහකාර තනතුර දරණ අතරම, 1957 ඔක්තෝබර් මස 26 වැනි දින සිට එක්සත් රාජධානියේ ලංකා මහ කොමසාරිස් තුමාගේ කාර්‍යාලයයේ තවදුර සේවය සඳහා කපිතාන් සී. ප්‍රනාන්දු මහතා තාවකාලිකව පත්කොට තිබේ.

**උසස් කිරීම**

එක්සත් රාජධානියේ ලංකා මහ කොමසාරිස් තුමාගේ කාර්‍යාලයයේ සේවය කරන අතරම, 1957 ඔක්තෝබර් මස 26 වැනි දින සිට තවදුර සේවය සඳහා ලෝකල් මේජර් කෙනෙකු වශයෙන්—

කපිතාන් සී. ප්‍රනාන්දු, සී.ජී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 දෙසැම්බර් මස 13 වැනි දින.


5—ජේ. ඇන්. බී 10439—4,004 (12/58)

**1959 අංක 4**

අංකය : ඩී/වී ඇෆ්ජ./17/ඒ.

**යුද්ධ හමුදව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1958 ජනවාරි මස 1 වැනි දින සිට, මේජර් කෙනෙකු වශයෙන්.—

කපිතන් තැන්පත් ඇස්. සී. කුරුකුලසූරිය, සී.සී.සී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 දෙසැම්බර් මස 13 දින.

---

**1959 අංක 5**

අංකය : ඩී/වීඇෆ්ජ්/17/ඒ.

**යුද්ධ හමුදව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම් සහ උප සේවයට මාරු කිරීම**

**උසස් කිරීම්**

ඔවුන්ගේ නම්වලට කෙළින් සඳහන් කර තිබෙන දින සිට, ලංකා ශිෂ්‍ය භට බලකායේ ලෙප්ටිනන්ට් වරුන් වශයෙන්—

උප ලෙප්ටිනන්ට් තැන්පත් ජේ. ඒ. ඩේවිඩ්—1957 මාර්තු මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ආර්. වයි. fපිව්—1957 මාර්තු මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ඒ. ඇන්. පෙරේරා—1957 මාර්තු මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් බී. ජී. ඇන්. සරිfපාඩීන්—1957 අගෝස්තු මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ඇන්. බී. ඇස්. බලල්ලේ—1958 ජනවාරි මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් බී. ඇම්. ඇම්. ඇස්. ඇල්. බී. අමරනායක—1958 ජනවාරි මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ආර්. ඇල්. ගුණතිලක—1958 ජනවාරි මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ඇස්. බී. ජේ. පුවිමානසිංහ—1958 ජනවාරි මස 1 වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ජී. එච්. ධර්මදාස—1958 ජනවාරි මස 1වැනි දින සිට.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ඇම්. ටී. එච්. පෙරේරා—1958 ජනවාරි මස 1 වැනි දින සිට.

**මාරු කිරීම්**

1958 ඔක්තෝබර් මස 4 වැනි දින සිට, ලංකා ශිෂ්‍ය භට බලකායේ උප සේවයට මාරුකරන ලදි—

ලෙප්ටිනන්ට් තැන්පත් ජේ. ඒ. ඩේවිඩ්, සී.සී.සී.
ලෙප්ටිනන්ට් තැන්පත් ආර්. වයි. fපිව්, සී.සී.සී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 දෙසැම්බර් 13 දින.

---

**1959 අංක 6**

අංකය : ඩී/වීඇෆ්ජ්/17/ඒ.

**යුද්ධ හමුදව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත්කිරීම සහ තාවකාලිකව වෙන නිළයකට පත්කිරීම**

**පත්කිරීම**

1958 නොවැම්බර් මස 1 වැනි දින සිට, ලංකා ශිෂ්‍ය භට බලකායේ උප ලෙප්ටිනන්ට් කෙනෙකු වශයෙන්—

නාගලිංගම් රත්නසිංහම් මහතා.

**තාවකාලිකව වෙන නිළයකට පත්කිරීම**

උප ලෙප්ටිනන්ට් තැන්පත් ඇන්. රත්නසිංහම්, සී.සී.සී., මහතා, 1958 නොවැම්බර් මස 1 වැනි දින සිට එම බලකායේ කණිෂ්ඨ කොට්ඨාශයේ සේවය සඳහා තාවකාලිකව පත් කොට තිබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 දෙසැම්බර් මස 13 දින.

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම්

**1959 අංක 7**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඑල්. 2ඒ/56.

ඩී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා, 1958 දෙසැම්බර් 17 වැනි දින පටන් 30 වැනි දින දක්වා, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බිදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එසුරපාඩම් මහතා 1958 දෙසැම්බර 17 වැනි දින පටන් 20 වැනි දින දක්වා, පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා පේදුරු තුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේජීජ්. 40/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා, 1958 දෙසැම්බර් 15වැනි දින, දඹුල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 8,821 නඩුව ඇහීමට හා 1958 දෙසැම්බර් 20 වැනි දින, දඹුල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 8,821 නඩුවේ තීන්දුව දීමට, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඩී. කරුණාරත්න මහතා 1958 දෙසැම්බර් 17 වැනි දින, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කුරුණෑගල, කනදුල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජේජ්. 57/48.

සී. එම්. තර්මලිංගම් මහතා 1959 ජනවාරි 22 වැනි දින, වවුනියාවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 30,902 නඩුව ඇහීමට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 45/48.

වී. ටී. පණ්ඩිත ගුණවර්දන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරනතුරු ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1958 දෙසැම්බර් 22 වැනි දින පටන් 24 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා 1958 දෙසැම්බර් 20 වැනි දින පටන් 22 වැනි දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ, මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. මතවරාජ මහතා 1958 දෙසැම්බර් 20 වැනි දින, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6/48.

ඒ. ඊ. ආර්. කොරයා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1958 දෙසැම්බර් 31 වැනි දින, මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49/48.

**එස්.** එන්. රාදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1958 දෙසැම්බර් 24 වැනි දින, ජේදුරු තුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා ජේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1958 දෙසැම්බර් 23 වැනි දින පටන් 1959 ජනවාරි 2 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයම.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උඩලාගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ජේ. සී. පීරිස් මහතා 1958 දෙසැම්බර් 24 වැනි හා 25 වැනි දිනයන්හි, පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පිඒල්/සී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ, නැවත නියමයක් කරන තුරු, බී. පී. පියසේන මහතා 1958 දෙසැම්බර් 22 වැනි දින පටන් 24 වැනි දින දක්වා, 26, 27 හා 29 වැනි දින වන් 31 වැනි දින දක්වා, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එන්. 1/50.

එන්. නල්ලසේගරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආර්. රාජේන්ද්‍ර මහතා 1958 දෙසැම්බර් 26 වැනි හා 27 වැනි දිනයන්හි, යාපනය දිස්ත්‍රික්කයේ උතුරු හා නැගෙනහිර වලිකාමම්, වඩමරාච්චි හා යාපනය, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/සී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, ඩබ්ලිව්. ඩයස් ද සිංහ මහතා 1958 දෙසැම්බර් 15 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ දකුණු හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එච්. 2/48.

ඒ. එස්. හේරත් ගුණරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. බී. රත්නායක මහතා 1958 දෙසැම්බර් 17 වැනි දින පටන් 20 වැනි දින දක්වා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ හා දඹදෙණි හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/ ටී. 3/53.

එච්. එස්. තිලකරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. පෙරේරා මහතා 1958 දෙසැම්බර් 29 වැනි දින පටන් 31 වැනි දින දක්වා, බදුළු දිස්ත්‍රික්කයේ යටිකිඳ–වියලුව, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා බුත්තල, ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. මයිල්වාගනම් මහතා 1958 දෙසැම්බර් 22 වැනි හා 23 වැනි දිනයන්හි වවුනියා හා යාපන දිස්ත්‍රික්කවල, උතුරු වවුනියාවේ හා මුහුදුබඩ පත්තු, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා පූනකාරි තුනුකායි, ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එම්. 3/48.

එච්. මීදෙණිය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ජී. බී. පෙරේරා මහතා 1958 දෙසැම්බර් 30 වැනි හා 31 වැනි දිනයන්හි, කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල්, පරණකුරු, ගල්බඩ, හා කිණිගොඩ කෝරලයන්හි ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 දෙසැම්බර් 20 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය. 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

**1959 අංක 8**

අංක : ඕ.ඇම්. 4/1/11 ඇෆ්.

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරුකිරීම පහත දැනුම් දී ඇති දිනයේ සිට බල පැවැත්වේ :—

1958 දෙසැම්බර් මස 20 වැනිද සිට නැවත නියම කරනතුරු, ලංකා විදේශ සේවයේ පස්වැනි පෙළේ අයි. බී. පොන්සේකා මහතා චීනයේ ලංකා තානාපති කාර්යාලයේ විදේශ සේවයේ පස්වැනි පෙළේ දෙවැනි ලේකම් වශයෙන්.

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 දෙසැම්බර් 22 දින,
කොළඹ 1, සෙනේට් මන්දිරයේදීය.

---

අංකය : ජී. 14/37/2.

**1959 අංක 9**

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් සමාදාන විනිශ්චයකාර ෆිලික්ස් එස්. පෝල් මහතා මන්නාරම් අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් නිලනොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් පත්කර ඇත්තේය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ නිවේදනයකින් සංශෝධනය කරන ලද 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් එම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිව්රුම් සහතික කිරීම පිණිස 1958 දෙසැම්බර් මස 23 වෙනි දින සිට හැටන් පිස්කල් මාර්ෂල් තැන වශයෙන් වැඩබලන කාලය තුළ පී. බී. වීරසූරිය මහතා හැටන් අධිකරණ කොට්ඨාශයට විශේෂ නිලධාරියෙක් වශයෙන් පත්කර ඇත්තේය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්,

1958 දෙසැම්බර් මස 19 වෙනි දින සිට එස්. පද්මනාදන් මහතා නැවත වැඩ බාරගන්නාතුරු වවුනියා දිස්ත්‍රික්කයේ නාඩුවෙඩ්කුලම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ටී. නාගමනි මහතාද,

1958 දෙසැම්බර් මස 20 වෙනි දින සිට කේ. මීරාමොහිඩීන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉලුක්කඩවෙයි, වෙල්ලන්කුලම් සහ විදත්තලිතිව් යන ගම්මුලාදෑනි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. පොන්නයියා මහතාද,

1958 දෙසැම්බර් මස 22 වෙනි දින සිට ජේ. ඩී. ඩබ්ලිව්. වාකිස්ටා මහතා නැවත වැඩ භාරගන්නාතුරු නුවරඑලිය දිස්ත්‍රික්කයේ දිඹුල්ල කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඩී. පී. රණසිංහ මහතාද,

1958 දෙසැම්බර් මස 23 වෙනි දින සිට ජේ. රත්නායක මහතා නැවත වැඩ භාරගන්නාතුරු කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ උඩුගහ පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එම්. කේ. ඩබ්ලිව්. පොන්සේකා මහතාද,

පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1958 දෙසැම්බර් මස 30 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

# ආණ්ඩුවේ නිවේදන

## සමිති සමාගම් ආඥපනත (105 වැනි පරිච්ඡේදය)

වැඩබලන වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් ලක්ෂමන් රාජපක්ෂ වන මම, අංක 9,773 හා 1947 සැප්තැම්බර් 24 දින දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ප්‍රකාශයෙන් මඳක් වෙනස් කර ඇති සමිති සමාගම් ආඥපනතේ (105 වැනි පරිච්ඡේදය) 3 වැනි හා 4 වැනි වගන්තිවලින් මට පවරා ඇති බලතල ප්‍රකාර මෙම නිවේදනයෙන්—

(අ) ''සීමාසහිත ශ්‍රී ලංකා අධ්‍යාපන සංවර්ධන සමිතිය'' නමින් පිහිටුවා ඇති සමිතිය පිහිටුවීමේ අභිප්‍රාව, එම ආඥපනතේ බලතල හිමිවිය යුතු අභිප්‍රාවක් වශයෙන් බලය පැවරීම ; සහ

(ආ) සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා යටත් පිරිසෙයින් රුපියල් 10,000ක් අරමුදලක් අවශ්‍ය වන 5(1) දරණ වගන්තියේ විධි විධාන වලින් එම සමිතිය නිදහස් කරමින් එම සමිතියට එම ආඥපනතේ බලපෑම සීමාකිරීමද කරමි.

ලක්ෂමන් රාජපක්ෂ,
වැඩ බලන වාණිජ හා වෙළඳ ඇමති.

1958 දෙසැම්බර් 9 වැනි දින,
කොළඹදීය.

## සමිති සමාගම් ආඥපනත (105 වැනි පරිච්ඡේදය)

වැඩබලන වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් ලක්ෂ්මන් රාජපක්ෂ වන මම අංක 9,773 හා 1947 සැප්තැම්බර් 24 වැනි දින දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ප්‍රකාශයෙන් මඳක් වෙනස් කර ඇති සමිති සමාගම් ආඥපනතේ (105 වැනි පරිච්ඡේදය) 3 (බී) දරණ වගන්තියෙන් මට පවරා ඇති බලතල ප්‍රකාර ''සීමාසහිත පාලිත මහා අධ්‍යාපනික සමිතිය'' නමින් පිහිටුවා ඇති සමිතිය පිහිටුවීමේ අභිප්‍රාව අංක 10,703 හා 1954 අගෝස්තු 13 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන් සමිති සමාගම් පනතේ (105 වැනි පරිච්ඡේදය) බලතල හා පහසුකම් හිමිකර ඇති අභිප්‍රාවක් බව මෙම නිවේදනයෙන් අනුමත කරමි.

ලක්ෂ්මන් රාජපක්ෂ,
වැඩබලන වාණිජ හා වෙළඳ ඇමති.

1958 දෙසැම්බර් 13 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනත

### නිවේදනයයි

1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනතේ 4 (1) ඡෙදය යටතේ ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා විසින් මෙම මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් 1958.12.26 සිට අවුරුදු පහක කාලයකට සිවිල් නිලධාරි එච්. එස්. වනසිංහ මහතා පත්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ධර්මසේන ජයනෙත්ති,
වැඩබලන නිත්‍ය ලේකම්.

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය,
1958 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹදීය.

## 1950 අංක 25 දරණ ආහර පාලන පනත

### බර අනුව හාල් විකිණීම

1952 ආහාර පාලන රෙගුලාසිවල ''ඊ'' ශීර්ෂයේ III වෙනි කොටසේ 4(1) දරණ රෙගුලාසිය අනුව, 1959 ජනවාරි 5 වෙනි දින සිට, සලාක ක්‍රමය බලපවත්වන කොළඹ, ගාල්ල, යාපනය, කෑගල්ල, මන්නාරම සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුළ පදිංචි, මීට යාකොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසියම් පංතියකට අයත් සලාක පොතක් හිමි කෙනෙකුට, සතියකට බර අනුව විකිණිය යුතු හෝ නිකුත් කළ යුතු හාල් සලාකය එම උපලේඛනයේ එක එක පංතිය ඉදිරියෙන් 2 වෙනි තීරයේ සඳහන් කොට ඇති සහල් ප්‍රමාණය බව මෙයින් දැනුම් දෙමි.

### උපලෙඛනය

| 1 වෙනි තීරය පංතිය | 2 වෙනි තීරය හාල් (රාත්තල් වලින්) |
|---|---|
| ළදරුවා ... ... ... | 4 |
| ළමයා ... ... ... | 4 |
| සාමාන්‍ය ... ... ... | 4 |
| කම්කරුවා ... ... ... | 4 |

**සැ.යු.**—හාල් සේරු 1ක් රාත්තල් 2කට සමානවේ. කූපන් දුන්විට පාරිභෝගිකයින්ට සලාක පොතක් සඳහා සතියකට හාල් සේරු 2ක් වෙනුවට මේ අනුව රාත්තල් හතරක් වශයෙන් හාල් ලැබෙනවා ඇත.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර පාලක සහ ආහාර කොමසාරිස්.

1958 දෙසැම්බර් මස 30 දින,
කොළඹදීය.

---

### ශුද්ධියක්

1958 දෙසැම්බර් 19 වැනි සිකුරාද අංක 11,618 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) ඡෙදයෙහි 3,868 පිටුවෙහි '' 1950 අංක 25 දරණ ආහාර පාලන පනත '' යටතේ පලවූ නියෝගයේ '' අංක 208 දරණ නියෝගය **'' අංක 108 දරණ නියෝගය ''** යනුවෙන් සංශොධනය විය යුතුයි.

---

## 4 බී පෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස්තැන.

1958ක්වූ දෙසැම්බර් මස 30 වෙනි දින දීය.
කොළඹ.

### උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J 5—2.7.50 ... | මොරිස් ආරුමුගම්, ගවරවිල වත්ත, අප්කොට් ... | නෝන බත්දූසාමා (භාර්‍යාව), ක්‍රිස්තෝපර් විජේන්ද්‍රන් (පුතා) |
| J 433—11.2.51 ... | සෙබස්තියන් මයිකල්, ග්ලෙන්ගරිෆ් වත්ත, නෝටන් බ්‍රිජ්... | සින්න මදලෙයිඅම්මාල් (භාර්‍යාව), අන්තෝනිමුත්තු (පුතා), ආරෝකියමේරි (දුව) |
| J 904—16.1.51 ... | මානික්කම් නල්ලම්මා, වලමාලෙයි කොටස, ලක්ෂපාන වතුයාය, මස්කෙළිය | මරුදයි (දුව), ආරුමුගම් (පුතා), මාරියායි (දුව) |
| J 963—16.1.51 ... | කරුප්පන්නන් පෙරියන්නන්, වලමාලෙයි කොටස, ලක්ෂපාන වතුයාය, මස්කෙළිය | සින්නපිල්ලෙයි (භාර්‍යාව) |
| J 965—16.1.51 ... | නාග රාජු, වලමාලෙයි කොටස, ලක්ෂපාන වතුයාය, මස්කෙළිය | පාප්පාති (භාර්‍යාව), මාරියායි නොහොත් මුනිඅම්මාල් (දුව), තන්ගම්මා (දුව), තනලෙච්චුමි (දුව), ගනේසන් (පුතා) |
| J 967—16.1.51 ... | නාක්කප්පන් නාරායනන්, වලමාලෙයි කොටස, ලක්ෂපාන වතුයාය, මස්කෙළිය | කාමාච්චි (භාර්‍යාව), තිරුපති (පුතා), පොම්මක්කා (දුව), |
| J 969—16.1.51 ... | අරපුලි වීරප්පන්, වලමාලෙයි කොටස, ලක්ෂපාන වතුයාය, මස්කෙළිය | ආරායි (භාර්‍යාව), මුරුගායි (දුව), පෙරිඅක්කා (දුව), සන්ගපිල්ලෙයි (පුතා) |
| J 1015—16.1.51 ... | සිදම්බරම් රෙන්ගප්පන්, වලමාලෙයි කොටස, ලක්ෂපාන, වතුයාය, මස්කෙළිය | වීරම්මා (භාර්‍යාව) |
| J 1536—29.5.51 ... | මුනිසාමි සිවනු, යූ. ඩී. කේ. වෙලේඹය වත්ත, හැටන් ... | පලනිඅම්මා (භාර්‍යාව), සින්තාමනි (දුව), අන්නස්වාමි (පුතා), අමරාවති (දුව) |

| ඉල්ලුම් පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිවීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J 1750—20.5.51 | ... සින්නකරුප්පන් වේළු, එමලිනා කොටස, බ්‍රන්ස්වික් වතුයාය, මස්කෙළිය | මීනම්මා (භාර්‍යාව) |
| J 1794—18.6.51 | ... අලගප්පන් සිවපෙරුමාල්, බ්‍රන්ස්වික් වතුයාය, මස්කෙළිය ... | සෙල්ලම්මා (භාර්‍යාව), වෙල්ලයම්මා (දුව) |
| J 1803—20.5.51 | ... ආරුමුගම් වීරන්, එමලිනා කොටස බ්‍රන්ස්වික් වතුයාය, මස්කෙළිය | සෙල්ලායි (භාර්‍යාව), සෙවනායි (දුව), මාරියායි නොහොත් මාදම්මා (දුව) |
| J 1821—20.5.51 | ... නාන්ඩවන් මුරුගන්ගේ වැන්දඹුවවූ අන්ගම්මා, ඩැනොටාර් කොටස, බ්‍රන්ස්වික් වතුයාය, මස්කෙළිය | වයිරන් නොහොත් මුත්තුසාමි (පුතා), කුල්ලන් නොහොත් මුත්තුසාමි (පුතා), ගෝපාල් (පුතා), ක්‍රිෂ්නන් (පුතා), පාර්වතී නොහොත් කනගවල්ලි (දුව), නාරායනසාමි (පුතා) |
| J 1942—17.6.51 | ... වෙල්ලයන් මුත්තුකරුප්පන්, ග්ලෙන්ටිල්ට් කොටස, ග්ලෙන්ටිල්ට් වතුයාය, මස්කෙළිය | සිට්ටු (භාර්‍යාව), කාලි අම්මා (දුව), කන්දයියා (පුතා), තෙයිවානෙයි (දුව) |
| J 1945—17.6.51 | ... අරපුල්ලි මුත්තුසාමි, ග්ලෙන්ටිල්ට් කොටස, ග්ලෙන්ටිල්ට් වතුයාය, මස්කෙළිය | වේලායි (භාර්‍යාව), කන්දන් නොහොත් මුත්තුසාමි (පුතා) |
| J 2181—18.6.51 | ... තිරුමාලෙයි කිට්ටන්, ලුකෝම්බ් වත්ත, මස්කෙළිය ... | ආරායි (භාර්‍යාව), රාමර් නොහොත් පොක්රාමන් (පුතා), මුත්තයියා නොහොත් සතාසිවම් (පුතා), මීනාල් නොහොත් උන්නමලෙයි (දුව), කාලිමුත්තු නොහොත් රාමසාමි (පුතා), රාමක්‍රිෂ්නන් (පුතා) |
| J 2225—17.6.51 | ... සින්නතම්බි පෙරියසාමි, ග්ලෙන්ටිල්ට් කොටස, ග්ලෙන්ටිල්ට් වතුයාය, මස්කෙළිය | මුත්තම්මා (භාර්‍යාව), අම්සවල්ලි (දුව), මුනියන්ඩි (පුතා) සෙල්ලම්මා (දුව), මරිඅම්මා නොහොත් මාරියායි (දුව) |
| J 2245—17.6.51 | ... රාමසාමි පේච්චිමුත්තු, ග්ලෙන්ටිල්ට් කොටස, ග්ලෙන්ටිල්ට් වතුයාය, මස්කෙළිය | අම්මාල් (භාර්‍යාව), කාතායි (දුව), සින්නම්මා (දුව), ආච්චිකන්නු (දුව), චන්ද්‍රබෝස් (පුතා), කමළම් (දුව), කනේසන් (පුතා) |
| J 2262—17.6.51 | ... පෙරියන්නන් පෙරුමාල්, ග්ලෙන්ටිල්ට් කොටස, ග්ලෙන්ටිල්ට් වතුයාය, මස්කෙළිය | පාප්පාති (භාර්‍යාව), තනපාකියම් (දුව), සරස්වති (දුව), තෙයිවමනි (දුව), ලෙච්චුමී (දුව), තෝට්ටිච්චි (දුව) |

# විවිධ දෙපාර්තමේන්තුවේ දැන්වීම්

## ප්‍රකාශනයයි

වයඹ පලාතේ හලාවත දිස්ත්‍රික්කයේ පිටිගල් කෝරලේ ආදයම් නිලධාරි කොට්ඨාශයේ ඕතරපලාතේ අංක 465 දරණ තුලාවල ගම්මුලාදැනි වසමේ ගම්වල ගවයන් අතර "කුර හා මුව රෝගය" නමැති රෝගය පැතිරි යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයර්‍යදස අමරසිංහ වන මම සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය සහ 1957 අංක 33 දරණ පණතේ සංශොධනය යටතේ මට පැවරී තිබෙන බල තල අනුව පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට : යක්දෙස්සාව ගම් සීමාව,

දකුණට : කිරිමැටියන ගම් සීමාව,

නැගෙනහිරට : කොස්වත්ත ගම් සීමාව,

බස්නාහිරට : කහටවිල ගම් සීමාව.

2. මෙම ආඥාපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද, "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදෙශයක ඒ ඒ නිලධාරින් විසින් නීතියානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර හලාවත පශු වෛද්‍ය තැනගෙන් හෝ පිටිගල් කෝරලේ දකුණ කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කාර්‍යාලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයර්‍යදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958ක්වූ දෙසැම්බර් මස 22 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්‍යාලයේ දීය.

# විශෙෂ නිවේදනයයි

1959 ජනවාරි 14 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 ජනවාරි 16 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 ජනවාරි 12 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 දෙසැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගනුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින සිට** අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අහලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුවම අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... .. | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.